Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

ජූලි 2 වන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

# ගයා වයා විඳිමු ළමා ගී.

සුරතල් නංගියෙ අපෙ අම්මා - ඇඟ ලේ කැටි කිරි කර නම්මා
පොඩි අවදියෙ අපහට පෙව් හිනදා - අම්මට මම වැන්දා



අයියා කීවා මට හරි නෑ - තාත්ත අම්මට වැඩිය අගේ
නිතරම අප ගැන වෙහෙසෙන හින්දා - පියාට මම වැන්දා


නංගී එය හිතුවොත් වැරදී - එතකොට නංගිට පව් සිදුවේ
ඔබ පොඩි කාලේ හුරතල් බල බල - අම්මා දුක් වින්දා



තාත්තා දොදොලුත් දෙන්නේය - දුන්නම අයියත් කන්නේය
මදි වී තව ඉල්ලන්නෙත් අයියයි - බැන්නෙත් අද අයියයි....

දොදොල් තියා මොනවා දුන්නත් - මෝඩියෙ කොපමණ උඩපැන්නත්
අම්මා පියාට වැඩිය හොඳයි මට - නංගියෙ ඔබ බැන්නත්..

නටුම් බලන්නට එදා ගොසින් - මිනිස්සු වටවී සිටිය නිසා
මාව වඩාගෙන පෙන්නුවෙ අයියේ - තාත්තා නොවෙද මගේ



නංගිගෙ තාත්තා කළුම කළුයි - අපෙ අම්මානම් සුදුම සුදුයි
එබැවින් අම්මා පියාට වැඩියෙන් - සුදුපාටින් ඉහළයි

අයියේ සුදු නම් ලස්සන ද - පොල් බෑයත් හරි සුදු නේද
එහෙනම් අයියට සැමටම වැඩියෙන් - ලස්සන පොල් බෑයයි



නංගී හොඳනෑ දඟ කෙල්ල - කොයි දේකටවත් නෑ මෙල්ල
අම්මා ඔබ හට ලෙඩ සෑදුන විට - කඳුලු සලා හැඬුවා

ඔය වචනය අයියේ හරි නෑ - අඬන්නනම් කාටත් බැරියෑ
දවසක් අයියත් දොර ලඟ වැටිලා - හූ කිය කිය ඇඬුවේ

අපි මෙය දැන් බේරා ගනිමු - සිරි අයියාගෙන් ගොස් අසමු
අම්ම ද තාත්ත ද හොඳ කියලා - එතකොට සිරි අයියා කියයි



ඔවු ඔව් මම ඒකට කැමතියි - සිරි අයියලා මේවා දනිති
යමු යමු අයියේ යමු යමු අයියේ - සිරි අයියා ලඟට

සිරි අයියේ කරුණක් අසමි - අම්ම ද තාත්තද වැඩිය අගේ
කරුණාවෙන් සිරි අයියා අප හට - බේරා දෙනවාද

අම්මා හොඳයි කීවොත් වැරදී - තාත්තා හොඳයි කීවත් වැදී
එබැවින් නංගියෙ මල්ලියෙ පවසමි - දෙන්නම හොඳය කියා

පුහුණුවට

පහත දී ඇති සබැඳියා ඔස්සේ ඉහත දැක්වෙන “සුරතල් නංගියෙ අපෙ අම්මා” ගීතය හොඳින් ශ්‍රවණය කරන්න. මෙම ගීතය සරල තනුවක් බැවින් ගායනා කිරීමට හුරුවන්න. https://youtu.be/3gW0bkUIEO4

https://youtu.be/xbmQUk6Xb9s